**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

**ඒකාබද්ධ ග්‍රාම - නගර සංවර්ධන සහ දේශගුණ තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය (IRDCRP)**

THE WORLD BANK

# ව්‍යාපෘති කාර්යමණ්ඩලය බඳවා ගැනීම

ඒකාබද්ධ ග්‍රාම - නගර සංවර්ධන සහ දේශගුණ තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය (IRDCRP), කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘතියක් වන අතර, ඒ සඳහා ශ්‍රී ලංකා රජය (GOSL) සහ ලෝක බැංකුව (WB) එක්ව අරමුදල් සපයයි. සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 103 ක් වන අතර, ගොවිපොළෙහි සිට පාරිභෝගිකයා දක්වා වන අගයදාමය තුළ හඳුනාගත් ගැටලු වලට පිළියම් සෙවීම සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ධීවර සහ වැවිලි යන ක්ෂේත්‍රයන්හි නියුතු කුඩා හා මධ්‍ය පරිමාණ කෘෂි ව්‍යවසායකයින්ට සහයවීමට මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශයන්හි පදිංචි කෘෂි ආහාර නිෂ්පාදකයින්ගේ ඵලදායීතාව, තරගකාරීත්වය සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම මෙම පස් අවුරුදු ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණ වේ.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි (PMU) පවතින පහත සඳහන් තනතුරු පුරප්පාඩු (01 සිට 04) සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට ශ්‍රී ලංකා පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. එක් එක් තනතුර සඳහා වන වැටුප් පරිමාණය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2019 මාර්තු 05 වන දිනැති අංක 01/2019 දරන චක්‍රලේඛය පරිදි වේ.

| අංකය | වැටුප් කාණ්ඩය | තනතුරු නාමය | පුරප්පාඩු ගණන |
|---|---|---|---|
| 01 | PS 3 | අධීක්ෂණ සහ ඇගයීම් විශේෂඥ | 01 |
| 02 | PS 3 | ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් කළමනාකරණ විශේෂඥ | 01 |
| 03 | PS 3 | ජ්‍යෙෂ්ඨ පරිසර විශේෂඥ | 01 |
| 04 | PS 3 | ජ්‍යෙෂ්ඨ සමාජ සංවර්ධන විශේෂඥ | 01 |

**අවශ්‍ය මූලික සුදුසුකම් සහ පළපුරුද්ද - පහත (1) හෝ (2) හෝ (3)**

01. අදාළ ක්ෂේත්‍රයෙහි, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) පිළිගත් ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණකර තිබීම හෝ අදාළ ක්ෂේත්‍රයෙහි, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් උපාධියට සමාන සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයෙහි පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකමක් සමග කළමනාකරණ මට්ටමේ, අවම වශයෙන් වසර 12 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.
02. අදාළ ක්ෂේත්‍රයෙහි, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණකර තිබීම හෝ අදාළ ක්ෂේත්‍රයෙහි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් උපාධියට සමාන සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයෙහි පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකමක් සහ අදාළ ක්ෂේත්‍රයෙහි පශ්චාත් උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයෙහි වෘත්තීය ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකමක් සමග කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 09 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.
03. රජයේ දීප ව්‍යාප්ත සේවයේ I ශ්‍රේණියේ නිලධාරියකු වීම හෝ I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු 4 ක පළපුරුද්ද සමග අදාළ ක්ෂේත්‍රයෙහි සමාන තත්ත්වයක්.

**පොදු කොන්දේසි**

- වයස් සීමාව – අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු හැට දෙකට (62) නොවැඩි විය යුතුය.
- විදේශාධාර ව්‍යාපෘතියක ඉහළ හෝ සමාන තනතුරක සේවා පළපුරුද්දක් තිබීම.
- ප්‍රසම්පාදනය, ව්‍යාපාර සහ අගයදාම සංවර්ධනය, ඇලෙවිකරණය, සැපයුම් කළමනාකරණය, වැව් ප්‍රතිසංස්කරණය, 4P ව්‍යාපාර සංකල්පය සහ එල්ලංගා පද්ධති කළමනාකරණය, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.
- ඉංග්‍රීසි භාෂා ප්‍රවීණත්වය, පරිගණක සාක්ෂරතාවය සහ රජයේ නීතිරීති සහ රෙගුලාසි පිළිබඳ මනා දැනුමක් තිබීම.
- අදාළ ක්ෂේත්‍රයන්හි වෘත්තීය නිපුනතාවය අමතර සුදුසුකමක් වනු ඇත.
- සුදුසුකම් සහ පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබන අතර, ඉහත බඳවා ගැනීම් සම්බන්ධයෙන් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණය අවසාන තීරණය වේ.
- බඳවා ගැනීම් සම්බන්ධයෙන් වන ඕනෑම ආකාරයක අනිසි බලපෑම් කිරීම, නුසුදුසුකමක් වන අතර, එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබේ.

**අයදුම්පත්**

2025 ජූනි 29 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ජීව දත්ත තොරතුරු සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ තොරතුරු ඇතුළත් අයදුම්පත සමග සියලුම සහතිකවල පිටපත් අමුණා පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවන මෙන්ද https://does.google.com / forms.0.IS74ZiAK0HU21UIy7KSIZuCz-Iz3b_ddmtNB33tk74I/edit?pli=1 සබැඳිය ඔස්සේ ගූගල් පෝරමය පුරවන මෙන්ද සියලුම අයදුම්කරුවන් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ.

අයදුම්පත් බහා එවන කවරයෙහි ඉහළ වම් කෙලවරෙහි අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. දැනට රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය සේවයෙහි නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

**ලේකම්,**<br>
**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,**<br>
**අංක 80/5, ගොවිජන මන්දිරය,**<br>
**රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.**

වැඩිදුර තොරතුරු සඳහා **(https://www.agrimin.gov.lk)** වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

**ලේකම්,**<br>
**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය.**